# නිහඬව දිවි හිමියෙන් රටට සේවය කළ අසහාය විද්‍යාඥයා!



ආචාර්ය අමිත් මුනින්ද්‍රදාස

> "බිය" පිළිබඳ වරක් ඔහු ශිෂ්‍යයන්ට පැවසුවේ, මිනිසා වතුරට බියක් නොදැක්වූයේ නම්, කිසිදා මිනිසා වතුරේ නොගිලෙනු ඇති බවයි.

අද අප කතා කරන මේ සුවිශේෂී පුද්ගලයා ගැන ඔබ කිදෙනෙක් දන්නවාදැයි සැකයක් පවතී. නමුත් අප නොදන්නා දක්ෂ ශ්‍රී ලාංකික විද්‍යාඥයන් කිදෙනෙක් නිහඬව, දිවි හිමියෙන් රටට සේවය කරනවාද යන්නට මේ ලිපිය අපූරුව නිදසුනකි.

1966 වසරේ පානදුර ප්‍රදේශයේ උපන් "අමිත් මුනින්ද්‍රදාස," සිය ප්‍රාථමික අධ්‍යාපනය පානදුර සුමංගල විද්‍යාලයෙන් ද, උසස් අධ්‍යාපනය කොළඹ රාජකීය විද්‍යාලයෙන් ද හදාරා 1985 වසරේ මොරටුව විශ්වවිද්‍යාලයීය ඉංජිනේරු පීඨයට සුදුසුකම් ලැබීය. ගණිතය විෂය සඳහා උපන් හපනෙක් වූ ඔහු මොරටුව විශ්වවිද්‍යාලයේ ඉලෙක්ට්‍රොනික් හා ටෙලි සන්නිවේදන අංශයෙන් පළමු පෙළ පංති සාමර්ථයක් සහිතව උපාධිය අවසන් කිරීමට සමත්විය. ඉන් පසුව ඔහු සිය ආචාර්ය උපාධිය සඳහා තෝරාගත්තේ ලිවර්පූල් විශ්වවිද්‍යාලය යි. ඔහුගේ ආචාර්ය උපාධි ක්ෂේත්‍රය වූයේ ඉතා ගැඹුරු සෛද්ධාන්තික පිරි අර්ධ සන්නායක විෂය පථය යි. ආචාර්ය උපාධිය සාර්ථකව නිම කළ ආචාර්ය අමිත් මුනින්ද්‍රදාස, සිය රටට සේවය කිරීම පිණිස නැවත, මොරටුව විශ්වවිද්‍යාලයේ ඉලෙක්ට්‍රොනික හා ටෙලිසන්නිවේදන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයකු වශයෙන් සේවය ආරම්භ කළේය. 2003 සිට 2006 වසර දක්වා හෙතෙම එම දෙපාර්තමේන්තු ප්‍රධානියා ද විය.

ඔහුව නමින් හඳුනාගැනීමට තුඩුදුන් ඔහුගේ සහජ දක්ෂතාව ප්‍රකට වූවේ ශ්‍රී ලංකාව ත්‍රස්තවාදයෙන් දරුණු ලෙස බැටකමින් සිටි අවධියේදී ය. එනම් 2000 වසරේ යාපනය අර්ධද්වීපයේ යුද්ධය ඇවිළෙමින් තිබිය දී යාපන අර්ධද්වීපය ත්‍රස්තවාදීන්ට නතුවීම වැළැක්වීම පිණිස ශ්‍රී ලංකා රජය විදෙස් ආධාර ඉල්ලා සිටි විට චෙක් ජනරජයෙන් ශ්‍රී ලංකාවට පළමු වරට ඇණවුම් කළ මල්ටි බැරල් රොකට් ලෝන්චර්ස් (Multi-Barrel Rocket Launchers)ලැබුණි. නමුත් එම තොගය වරායෙන් ගොඩ බාන විට ඒවායේ වයර් සියල්ල කපා දමා තිබුණි. ශ්‍රී ලංකා යුද හමුදාවේ කිසිදු ඉංජිනේරුවරයකු මින් පෙර මල්ටි බැරල් පිළිබඳ කිසිදු පෙරහුරුවක් තිබූ අය නොවීය. එබැවින් රජය ඉතා බරපතල ප්‍රශ්නයකට මුහුණ දී සිටියහ. එහෙත් ජාතියේ වාසනාවට, උපන් විචක්ෂණශීලී බුද්ධියක් සහිත මිනිසෙක් වූ අමිත් මුනින්ද්‍රදසයන් එම ආයුධවල අත්පොත් නතියම හදාරා මල්ටි බැරල් රොකට් ලෝන්චර්ස් සියල්ල අලුත්වැඩියා කරන්නට සමත් වූයේ චෙක් ජනරජ ඉංජිනේරුවන් පවා විශ්මයට පත් කරවමිනි.

ඔහුගේ දක්ෂතාවන් මෙපමණකදු නොවේ. හෙතෙම නව නිර්මාණ අතිවිශාල සංඛ්‍යාවක් බිහිකළ නව නිර්මාණ කරුවෙකි. වරෙක ඔහු, Multi-phase-axial-flux-permanent-magnet-motor එකක් භාවිත කරමින් ඉලෙක්ට්‍රොනික් මෝටර් රථයක් නිෂ්පාදනය කළේය. මෙය සාමාන්‍ය, Single Phase හෝ Three Phase මෝටරයකින් ක්‍රියාත්මක කළ නොහැක්කක් විය. හෙතෙම ඒ සඳහා, Five-Phase Motor එකක ගණිතමය සංකල්පයක් (Mathematical Model) ඉදිරිපත් කර තිබුණි. ඊශ්‍රාලයේ දී අභිරහස් ලෙස මරණයට පත්වන විටත් ඔහු ඒ හා සම්බන්ධ පර්යේෂණවල නිරතව සිටියේය.

ක්වන්ටම් ඉලෙක්ට්‍රොනික විද්‍යාවේ ද පරතෙරට ගිය අයකු වූ ආචාර්ය අමිත්, ඉතා සාර්ථක ලෙස High-efficient-white-light emitting diode එකක් නිපදවීය. ශ්‍රී ලංකාවට නැනෝ තාක්ෂණය හඳුන්වාදීමේ පුරෝගාමී මෙහෙවරක් ද ඉටු කළ ආචාර්ය අමිත් මුනින්ද්‍රදස සිය පුත්‍රයාට වරෙක ලබාදුන් උපන්දින ත්‍යාගයක් වූයේ, සියතින්ම නිපදවන ලද, ගියර් පද්ධතියක් සහ ක්ලච් එකක් අන්තර්ගත විදුලි මෝටර් රථයකි.

ඉංජිනේරු විද්‍යාවේ ද පරතෙරට පැමිණි මොහු, ජායාරූපකරණයේ හා වන සත්ත්ව විද්‍යාවේ ද දක්ෂයකු විය. විසකුරු සතුන්ට කිසිදු ආකාරයක බියක් නොදැක්වූ ඔහු, සර්පයන්, ගෝනුස්සන් වැනි සතුන් සුරතලයට ඇති කළේය. ශ්‍රී ලංකාවට අවේණික මැඩියන් කුලයක් සොයාගැනීමට ද හෙතෙම සමත් විය. "Lankacornubatrachus" නමින් හැඳින්වුණු එම විශේෂයට සිය නම යොදන්නට ඔහු කිසි විටක උත්සාහ නොකළේය. ඊශ්‍රායලයට සිය අවසන් ගමන යන්නට පෙරදින රාත්‍රියයේ ද, ඔහු විසින් සොයාගත් ශ්‍රී ලංකාවට ආවේණික සත්ත්ව විශේෂයක් සම්බන්ධව හෙතෙම ලිපියක් සම්පාදනය කර තිබුණි.

"On any important occasion he would be seen in the 'National Dress' with his long hair tied behind, which led to quite a few of his students following suit."

ආචාර්ය අමිත් මුනින්ද්‍රදාස ඊශ්‍රාලයේ දී අභිරහස් ලෙස මිය ගියේ 2007 වසරේ ජූනි මස 11 වැනිදා ය. මේ මරණයට හේතුව ඔහු ඊශ්‍රාලයේ යුද රහස් අවබෝධ කරගැනීමට සමත් වූ නිසා යැයි ද කියැවුණි. එය එසේ වීමේ පුදුමයක් නැත. ජායාරූපකරණයේ සිට ගගනගාමී විද්‍යාව දක්වා සිය හැකියාවන් පෙන්වූ ඔහුට, ලොව වඩාත්ම සුරක්ෂිත (Classified) ඊශ්‍රායල යුද රහස් අවබෝධ කරගැනීම එතරම් දෙයක් නොවන්නට ඇත. එය කෙසේ සිදු වූවත්, මේ රටටත්, මුළු ලෝකයටත්, අති ශ්‍රේෂ්ඨ විද්‍යාඥයකුගේ ජීවිතය අහිමිවීම පමණක් එයින් සිදුවිය.

සැම වැදගත් උත්සවයක් සඳහාම තම දිගු කොන්ඩය ගැටගසා ජාතික ඇඳුම ඇඳීම පුරුද්දක් කරගත් මුනින්ද්‍රදාසයන් මියයන විට මොරටුව විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයකු පමණක් නොව, ආතර් සී. ක්ලාක් ආයතනයේ සහ Institute of Engineers Sri Lanka (IESL) හි උපදේශකවරයකු ලෙස, විදුලි සන්නිවේදන කොමිෂන් සභාවේ (TRC) Frequency Spectrum පාලන කමිටු සාමාජිකයකු ලෙස, Advisory Board on Satellite Telephony හි සාමාජිකයකු ලෙස සහ තාක්ෂණික විද්‍යායතන විශාල සංඛ්‍යාවක ක්‍රියාකාරී චරිතයක් ලෙස කටයුතු කරමින් සිටියේය.

"බිය" පිළිබඳ වරක් ඔහු ශිෂ්‍යයන්ට පැවසුවේ, මිනිසා වතුරට බියක් නොදැක්වූයේ නම්, කිසිදා මිනිසා වතුරේ නොගිලෙනු ඇති බවයි. හෙතෙම එය සනාථ කරමින්, ප්‍රායෝගිකවම කිසිදු පිහිනීමක් හෝ අත් ගැසීමකින් තොරව වතුරේ නොගිලී සිටීමට සමත් විය. ඔහු අසමසම පුද්ගලයකු වන්නේ මෙබඳු චරිත ලක්ෂණවලිනි. බොහෝ මිනිසුන් තම වෘත්තිය ගැන පම්පෝරි ගසා, තමා උගතා, තමා දක්ෂයා කියා කියවාගන්නා යුගයක මෙවැනි මිනිසුන් රටට අහිමිවීම අප සැමගේ අවාසනාවකි.

**ප්‍රදීප් පියතිලක**
**සන්නිවේදන සම මාධ්‍ය නිලධාරී**
**ජාතික මූලික අධ්‍යයන ආයතනය**
**මහනුවර**